# මඩකලපුවේ ප්‍රභාකරන්

මඩකලපු නාගරික සභාවේ නගරාධිපතිනිය ලෙස පද්මිණී ප්‍රභාකරන් මහත්මිය පත්කිරීමට පිල්ලෙයාන්ගේ පක්‍ෂය තීරණය කර ඇති බව වාර්තාවෙයි. ඒ මහත්මිය පසුගිය දා පවත්වන ලද පළාත්පාලන සභා ඡන්ද විමසීමේදී නාගරික සභාව සඳහා වැඩිම මනාප සංඛ්‍යාව ලබාගැනීමට සමත්වූවා ය. කිලිනොච්චියේ වේලුපිල්ලේ ප්‍රභාකරන්ගෙන් නැගෙනහිර පළාත නිදහස් කරගැනීමේ ක්‍රියාදාමයේ වැදගත් කොටස්කාරියක බවට මඩකලපුවේ පද්මිණී පභාකරන් මහත්මිය පත්වීමට ඉඩකඩ ඇත.

මඩකලපු දිස්ත්‍රික්කයේ පළාත් පාලන මැතිවරණය ප්‍රචණ්ඩ ක්‍රියාවලින් තොරව පැවැත්වීමට ලැබීම මෙරට හමුදාවල හා පොලීසියේ ජයග්‍රහණයකි. හමුදා යන්නෙන් ත්‍රිවිධ හමුදා මෙන් ම විශේෂ කාර්ය බලකාය ද හැඳින්වෙයි. හමුදාවන්ගේ කැපවීම, නිර්භීතභාවය, දක්‍ෂතාව, ඉවසීම ආදී ගුණාංග රාශියක් මෙහි දී අපේ ඇගයීමට ලක්වෙයි. එමෙන් ම හමුදාවට ලැබුණු දේශපාලන නායකත්වය ද අගය කළ යුතු ය. හමදාවන්ට කොටි සංවිධානය පරාජය කළ හැකිය යන්න මුල සිට ම අපේ ස්ථාවරය විය. හමුදා විසඳුම් ද දේශපාලන විසඳුම් බව ඇතැම් උගතුන්යැයි කියාගන්නා ඇංකරයන්ට මෙන් ම ඇතැම් දේශපාලනඥයන්ට ද නො වැටහෙයි.

කිනම් හෝ දේශපාලන නායකත්වයකින් තොර හමුදාවක් ලොවේ කිසිදා කිසි තැනක තිබී නැත. අපේ හමුදාවන්ට කොටි පැරදවීමේ හැකියාව තිබූ නමුත් ඒ සඳහා හමුදාව මෙහෙයවීමට තරම් කොන්දක් ඇති දේශපාලන නායකත්වයක් දශක තුනක පමණ කාලයක් රටෙහි නො වී ය. එමෙන් ම රාජ්‍ය නොවන සංවිධාන ද ඇතුළු විජාතික බලවේග හමුදා මෙහෙයුම්වලට විරුද්ධව ජනමතයක් ඇතිකිරීමට උත්සාහ කෙළේ ය. කිලිනොච්චියේ ප්‍රභාකරන්ගේ ඊනියා යුද්ධ දක්‍ෂතාව ගැන ඔහුගේ ඊනියා අනභිබවනීය කොටි ත්‍රස්තවාදීන් ගැන රාජ්‍ය නොවන උගත්තු බෙරිහන් දුන්හ. ඊනියා සිවිල් (සිවල්) සමාජය දිවා රෑ ඒ වෙනුවෙන් සම්මන්ත්‍රණ පැවැත්වූහ.

ලංකාව ඇතුළු ඊනියා තුන්වැනි ලෝකයේ ක්‍රියාත්මක වන බටහිරින් නඩත්තු කෙරෙන රාජ්‍ය නොවන සංවිධාන, සිවල් සමාජ ආදිය බටහිර යටත්විජිතවාදයේ ම අංග හා උපකරණ පමණ ය. මේ සියල්ල අයත්වන්නේ සංස්කෘතික යටත්විජිතවාදයට ය. එනම් බටහිර යුදෙව් ක්‍රිස්තියානි යරත්විජිතවාදයේ සංස්කෘතික සංරචකයට ය. මෙහි දී හොඳ රාජ්‍ය නොවන සංවිධාන යනුවෙන් වර්ගයක් නො වෙයි. පරිසරය ගැන කතාකරන, ගම්වල ජනතාවට විවිධාකාරයෙන් උපකාර කරන, එසේත් නැතහොත් ඊනියා ශාස්ත්‍රීය කටයුතුවල යෙදෙන රාජ්‍ය නොවන සංවිධාන ඇත. එහෙත් මේ සංවිධානවලට ද යම් න්‍යාය පත්‍රයක් වෙයි. ඒ ඇතැම්විට බටහිර මතවාද රටට ගෙනයෑම විය හැකි ය. එසේත් නැතහොත් කැපී පෙනෙන රාජ්‍ය නොවන සංවිධානවල විජාතික ක්‍රියාකාරකම් වසාගැනීමට යහපත් යැයි පෙනෙන රාජ්‍ය නොවන සංවිධාන පවත්වාගෙන යනවා විය හැකි ය.

ඒ කුමක් වුවත් අද කොටි සංවිධානය හමුදා මෙහෙයුම් මගින් පරාජය කළ යුතු ය යන මතයේ විශාල බහුතරයක් සිටීම ගැන අපි සතුටු වෙමු. අප (චින්තන පර්ෂදය) එකල කොටි නැසිය යුතු බව කියන විට අපට යුදවාදීන්, ජාතිවාදීන් ආදී වශයෙන් චෝදනා කළ අය ද මේ බහුතරයට අයත්වීමෙන් අපට ධෛර්යයක් ලැබෙයි. අපි දේශපාලන පක්‍ෂයක සාමාජිකයෝ නො වෙමු. අපට දේශපාලන පක්‍ෂයකට වඩා යමක් කළ හැකි බව පසුගිය දශක දෙකක පමණ කාලයෙහි තහවුරු වී ඇත. ඇතැම් දේශපාලන පක්‍ෂ මෙන් අහවල් දේ මුලින් ම කෙළේ අප යැයි කීමේ අවශ්‍යතාවක් අපට නො වෙයි. අප ක්‍රියාකරන්නේ දේශපාලන බලයක් ලබාගැනීමට නො වෙයි. එසේ වුවත් හමුදා මෙහෙයුම්වලට පක්‍ෂපාතී වන අතර ඊනියා නිජභූමි සංකල්පය පරාජය කිරීමට ද, උතුරු හා නැගෙනහිර පළාත් වෙන්කරවා ගැනීමට ද දශක දෙකක් පමණ කාලයක් උරදුන් බව අභිමානයෙන් සඳහන් කිරීමේ වරදක් ඇතැයි නො සිතමු.

මඩකලපුවේ දේශපාලන බලය වේළුපිල්ලේ ප්‍රභාකරන්ගෙන් පද්මිණී ප්‍රභාකරන් මහත්මිය අතට පත්වීම ගැන අපි සතුටු වෙමු. එහෙත් අපට තවත් බොහෝ දේ ඉතිරි වී ඇත. ඉන් පළමු කාර්යයක් වනුයේ නැගෙනහිර පළාතේ පළාත් සභා මැතිවරණය පැවැත්වීම ය. මෙරට දෙමළ ජාතිවාදයක් නැතැයි කියන්නන්ට අප සංකල්පීය වශයෙන් කියන කරන දෑ තේරුම් ගැනීමට නො හැකි ය. ජනතාවට මල්වෙඩි සංදර්ශන පෙන්වීම අපේ ප්‍රතිපත්තිය නො වෙයි. නිජභූමි

© Prof. Nalin De Silva

සංකල්පය පරාජයකිරීමත් උතුරු හා නැගෙනහිර පළාත් ප්‍රායෝගිකව ම වෙන්කිරීමත් සමග මෙරට දෙමළ ජාතිවාදය මහත් පරාජයක් ලබයි. අද අඩුම තරමින් සර්වපාක්ෂික නියෝජිත කමිටුවට සහභාගිවන දෙමළ පක්ෂ හා ආණ්ඩුවේ නැති ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය ද ඇතුළු මුස්ලිම් පක්ෂ ඒකීය රාජ්‍යය පිළිගනියි. එක්සත් ජාතික පක්ෂයට පවා සන්ධීය ස්ථාවරයෙන් බැහැරවීමට බල කෙරී ඇත. මුස්ලිම් කොංග්‍රසය එක්සත් ජාතික පක්ෂයේ හා කොටින්ගේ පාර්ලිමේන්තු නියෝජිතයා වූ දෙමළ ජාතික සංධානයේ නිල නොවන හවුලෙන් වෙන් වී මඩකලපු පළාත් පාලන නිලවරණයට සහභාගි වූ බව ද සඳහන් කළ යුතු ය. එහෙත් එපමණකින් දෙමළ ජාතිවාදය මුළුමනින් ම පරාජය වී ඇතැයි අපි නො කියමු. දෙමළ ජාතිවාදය පරාජය නොකර මෙරට ඇති වී තිබෙන ප්‍රශ්නය විසඳිය නොහැක්කේ ප්‍රශ්නයට හේතුව ම දෙමළ ජාතිවාදය බැවිනි. එබැවින් මෙරට දෙමළ ජාතිවාදයක් නැතැයි කියන්නන්ට ප්‍රශ්නයට විසඳුමක් නැත. එමෙන් ම මෙරට බහු සංස්කෘතික බහු වාර්ගික රටක් යැයි කියමින් සිංහල බෞද්ධ සංස්කෘතියට හිමි තැන දීමට විරුද්ධවන්නන්ට ද ප්‍රශ්නයට විසඳුමක් නැත. ඔවුහු මල්වෙඩි ප්‍රදර්ශකයෝ පමණක් වෙති. සිංහල දෙමළ මුස්ලිම් සමානතාවක් ගැන කතාකරන්නන් ඒ සම්බන්ධයෙන් ඉක්මවමින් ඇතැම් දෙමළ හා මුස්ලිම් පක්ෂ බුද්ධාගමට ප්‍රමුඛස්ථානය දීමට එකඟ වෙයි.

දෙමළ ජාතිවාදය පරාජය කිරීමේ න්‍යාය පත්‍රයෙහි මීළඟට ඇත්තේ නැඟෙනහිර පළාතේ පළාත්සභා මැතිවරණය පැවැත්වීම ය. ඒ සඳහා නාම යෝජනා පත්‍ර මාර්තු මස 28 වැනි දින සිට භාර ගැනීමට කටයුතු යොදා ඇත. මේ මැතිවරණයෙහි වැදගත්කම කිසිසේත් ම අවතක්සේරු නොකළ යුතු ය. මේ පවත්වන්නට යන්නේ උතුරු හා නැගෙනහිර පළාත්සභාමේ මැතිවරණයක් නො වෙයි. දෙමළ ජාතිවාදයේ ඊනියා නිජභූමියේ මැතිවරණයක් නො පැවැත්වෙයි. නගෙනහිර පළාත යනු අද තවත් පළාතක් පමණකි. එහි සිංහල දෙමළ මුස්ලිම් ජනයා සම සමව මෙන් වාසය කරති. උතුරු හා නැගෙනහිර පළාත් සහ එකතුකිරීමක් ගැන අද කතා නොකෙරෙයි. කිලිනොච්චියේ ප්‍රභාකරන් හා මඩකලපුවේ ප්‍රභාකරන් එකතුකිරීමක් නො සිදුවෙයි. බණ්ඩාරණායක චෙල්වනායගම් ගිවිසුමට එදා ජාතික බලවේග වැරුද්ධවීමට හේතු වූ ප්‍රධාන කරුණක් වූයේ එහි රටසභා දෙකකට හෝ වැඩි ගණනකට හෝ එකතුවීමට ඉඩ සලසා තිබීම ය. ඒ තර්ජනය මුළුමනින් ම පහ වී ගොස් ඇතැයි අපි නො කියමු. එහෙත් මල්වෙඩි සංදර්ශන නොපවත්වා කල්පනාකාරීව කටයුතු කිරීමෙන් ඒ අනතුර මුළුමනින් ම නැතිකර දැමිය හැකි ය.

නැගෙනහිර පළාතේ පළාත්සභා මැතිවරණයට තරඟ කිරීම සඳහා බලපෑමක් එක්සත් ජාතික පක්ෂයට පක්ෂ අභ්‍යන්තරයෙන් පැනනගිනු ඇත. අද බටහිරයන් කුමක් ප්‍රසිද්ධියේ කීව ද, ඔවුන්ට අවශ්‍ය වන්නේ නැගෙනහිර පළාත් සභා මැතිවරණය නො පැවැත්වීම ය. නැගෙනහිර පළාතේ පමණක් පළාත් සභා මැතිවරණය පැවැත්වීම ඔවුන්ගේ අනුග්‍රහය හා ආශිර්වාදය ලබන දෙමළ ජාතිවාදයට පරාජයකි. එබැවින් බටහිරයන් තමන්ට ගැති එ ජා ප නායකත්වයට මැතිවරණයට තරඟ නොකිරීමට උපදෙස් දෙනු ඇත. එ ජා ප නායකත්වය මඩකලපු දිස්ත්‍රික්කයේ නිලවරණවලට සහභාගි නොවූයේ ආයුධ ගත් සංවිධානයක් එහි තරඟ කළ නිසා නො වේ. බටහිරයන් එයට විරුද්ධ නිසා ය. ආයුධ ගත් කොටි සංවිධානයට තව තවත් ආයුධ දුන්නේ ප්‍රේමදාස මහතා ය. ජේ ආර් ජයවර්ධන මහතාගේ කළගෙඩි ලාම්පු සෙල්ලම මෙන් ම භීෂණ මැද පළමු පළාත් සභා මැතිවරණය හා ජනාධිපතිවරණය පැවැත්වූ ආකාරය ද අපට අමතක නො වෙයි. ප්‍රජාතන්ත්‍රවාදය ගැන, ජනතාවට බලය ලබාදීම ගැන දේශපාලනඥයන් කරන කතා මල් වෙඩි සංදර්ශන පමණ ය. එ ජා ප නායකයන් මැතිවරණ කොමසාරිස් කාර්යාලය ඉදිරිපිට ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් කරන ලද උද්ඝෝෂණය කැම දිරවීම සඳහා කරන ලද ව්‍යායමයක් පමණක් නොව ඊනියා ජාත්‍යන්තර ප්‍රජාවගේ (සිවල් සමාජයේ අනුග්‍රහකයන්ගේ) අවශ්‍යතාව මත ඔවුන්ට ලංකාවට එරෙහිව ඩැෂ් පහර එල්ලකිරීම සඳහා පන්දුව ඔසවා දීමක් ද වෙයි.

බටහිරයන්ගේ බලපෑම් හා පක්ෂ අභ්‍යන්තරයේ අවශ්‍යතා අතර කඹ ඇදීම කෙසේ කෙළවර වනු ඇත්දැයි කීමට නොහැක්කේ එ ජා ප අභ්‍යන්තර ශක්තිය පිළිබඳ තක්සේරුවක් නොමැතිවීම හේතුවෙනි. එහෙත් අපට එක් කරුණක් පැහැදිලි ව කිව හැකි ය. උතුරු හා නැගෙනහිර පළාත් වෙන්කිරීම කොසෝවෝ මාදිලියේ විසඳුම් දීමට බලාපොරොත්තුවන බටහිරයන්ගේ අපේක්ෂාව නො වෙයි. නැගෙනහිර පළාත් සභා මැතිවරණය වර්ජනයකිරීම සෘජුව හෝ වක්‍රව හෝ බටහිරයන්ගේ අපේක්ෂාව ඉටුකිරීමක් වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva